## සම්ප්‍රදායික ප්‍රඥාව සහ දේශගුණ විපර්යාසයට අනුහුරුවීම

මිනිස් සංහතියේ පැවැත්මට බරපතල තර්ජනයක් දැන් එල්ල වී ඇත. ඒ ගෝලීය උණුසුම සහ එහි එල විපාකයක් ලෙස එල්ල වන දේශගුණ විපර්යාස සහ මුහුදු මට්ටම ඉහළ යාම යන ද්වි තර්ජන හේතුවෙනි. න්‍යෂ්ටික යුද අවි නිපදවීමෙන් මෙපිටදී මිනිසා තමන්ගේම විනාශය සඳහා තම සහජාසය යොදාගෙන කළ නිර්මාණයක් ලෙස මේ විපතද සැලකිය හැකිය. ඒ එසේ වුවද තමන්ගේම නූපන් සහ අනාගත පරම්පරා බිලිදීමට වර්තමාන මිනිස් පරපුරට හිමිව ඇති වරප්‍රසාදය කුමක්ද?

දේශගුණ විපර්යාසය හේතුකොට තමන්ට එල්ලව ඇති ''සතුරු ප්‍රහාරය'' මැඩලීම හෝ වැළැක්වීම හෝ සඳහා ප්‍රවේශ දෙකක පිහිට පැතීමට මිනිසා උත්සාහ දරමින් සිටියි. ඉන් එකක් සංහිඳියාවය. අනෙක පවත්නා තත්වයට අනුහුරුවීමය. ශ්‍රී ලංකාව වැනි කුඩා, සංවර්ධනය වෙමින් පවතින රටකට මේ අහිතකර ප්‍රතිඵල සංසිඳවීම සඳහා ගත හැකි පියවර ඇත්නම් ඒ අල්පය. එවැනි පසුබිමක් තුළ අප පිළිසරණ පතා යා යුත්තේ, මෙවැනි උභතෝකොටික තත්වයන්ට කිසිදු දායකත්වයක් කිසිදා ලබා නොදී, දීර්ඝ කාලයක් සමෘද්ධියෙන් හා සෞභාග්‍යයෙන් ජීවිත ගෙවූ අපගේ මුතුන්මිත්තන්ගේ ආදර්ශමත් ජීවන රටාව කරාය.

අප පැරැන්නන් සිය ජලාශ හා වාරිමාර්ග ඇලවල් පහත් බිම්වල ඇතිකර ගොවිතැන් බත් කළෝය. මානව ජනාවාස පිහිටවූයේ උස් බිම් වලය. වන ආවරණය නොසිඳා රැක ගත්තේ ජලාශ සඳහා අවශ්‍ය ජල පෝෂිත සුරැකීම උදෙසාය. වැසි අඩුවෙන් වැටෙන උතුරු මැද පළාතෙහි ''එල්ලන්ගාව'' ලෙස හැඳින්වූ කුඩා වැව් පොකුණු සංවිධානය විය. එදා ඔවුහු ජලය නම් අති-අනර්ඝ සම්පත ක්‍රමානුකූලව එකතු කර ගැනීම එල ලැබීමට, බෙදා හැරීමට, යොදා ගැනීමට සහ ප්‍රති-චක්‍රීකරණයට ගැලපෙන හෝ භූමි අලංකරණය විද්‍යාත්මක බවකින් යුතුව සිදු කර ඇත්තේ පරිසර පද්ධතියට ගැලපෙන ආකාරයටය.

මේ වැව් පද්ධති පොකුරු පිළිබඳ අධ්‍යනයක් කළ ආචාර්ය සී. ආර්. පානබොක්කේ මහතා, විද්‍යාත්මක ඇසකින් බලන විට, ජල විද්‍යාත්මක සහ භූ විද්‍යාත්මක අවශ්‍යතාවන්ට ගැලපෙන පරිදි බෙදා හැරීමේ රටාව සහ වැව් සනත්වය සකස් වී ඇති බව පෙන්වා දෙයි. එසේම එක් අතකින් භූ රූප විද්‍යාව සහ භූමි භූදර්ශයට අනුවද අනෙක් අතින් වැසි වැටීමේ සමාජ සාධක මගින් මේ එල්ලන්ගාව පාලනය වීමත් දැකිය හැකි බවයි.

මේ එදා පාරම්පරික ඥානය භාවිතයෙන්, පරිසරය හා සමතුලිතතාව රැකගැනීමට දැන හො නොදැන හෝ විද්‍යාත්මක පසුබිමක් තුළ අපගේ පැරණි ඥාතීන් දැරූ එක් උත්සාහයකි.